මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

නිකුත් කළේ සන්නිවේදන දෙපාර්තමේන්තුව
දිනය 2021.12.10

# ණය තොරතුරු කාර්යාංශය විසින් "කොවිඩ්-19 සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ අරමුදල" වෙත රුපියල් මිලියන 50ක මුදලක් පිරිනමනු ලබයි.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් පිහිටුවන ලද ශ්‍රී ලංකාවෙහි කොවිඩ් - 19 වෛරස ව්‍යාප්තිය පාලනය කිරීම සහ ආශ්‍රිත සුබසාධන වැඩසටහන අරමුණු කරගත් "කොවිඩ්-19 සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ අරමුදල" වෙත දේශීයව පුළුල් වගකීම් සමූහයක් පැවරී තිබේ. දේශීය මෙන්ම විදේශීය පරිත්‍යාගශීලීන්ට ද "කොවිඩ්-19 සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ අරමුදල" වෙත තම මූල්‍ය දායකත්වයන් සිදු කළ හැකිය.

"කොවිඩ්-19 සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ අරමුදලෙහි" සභාපති ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවෙහි අධිපති, ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා ණය තොරතුරු කාර්යාංශයේ සාමාන්‍යාධිකාරී නන්දි ඇන්තනී මහතා විසින් "කොවිඩ්-19 සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ අරමුදල" වෙත පිරිනමන ලද රුපියල් මිලියන 50 ක පරිත්‍යාගය පිළිගන්නා ලදී.

